**හපුතලේ නගර සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හපුතලේ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිරි වර්ෂයට අදාළ සේවා ගිවිසුම් ගාස්තු සහ රක්ෂණ ගාස්තු රු.272,100 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සිදු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු මුද්දර ගාස්තු රු.472,875 ක් ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | කුලියට දීම සඳහා භාවිත කර තිබුණු GI බට 36 ක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | වත්කම් සමීක්ෂණයක් සිදුකර නිවැරදි අගයන් පොත්වලට ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී විවිධ ඉදිකිරීම්, සඳහා වැය කළ රු.1,140,588 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඉ) | නගර සභාවට එරෙහිව අධිකරණ දෙකක විභාග වෙමින් පවතින නඩු 02 ක් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී අදාළ හෙළිදරව් කිරීම් සිදු කරන බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 105,483,051 ක් වූ ඉඩම් හා ගොඩනැඟිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලීබඩු හා සවිකිරීම් යන වත්කම් විෂයයන් 03 ට අදාළ ශේෂ සනාථ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | XXIV පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය හා මියගිය නිලධාරීන් 18 දෙනෙකුගෙන් 1996 වර්ෂයේ සිට පැවත එන රු.61,651ක් වූ ණය ශේෂය අයකරගෙන නොතිබුණි. | ඉතා පැරණි හිඟ ශේෂයන් බැවින් තොරතුරු සොයා ගැනීමට අපහසු බව. | හිඟ ණය ශේෂ අය කරගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571(1) | වර්ෂ 02 ඉක්ම වූ රු.85,964 ක් වූ තැන්පත් ශේෂ 27 ක් නියාදනය කර නොතිබුණි. | තැන්පත් නියාදනය කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | | වාහන 15 ක සම්බන්ධයෙන් වාහන රාජ්‍ය ලාංඡන හා පළාත් පාලන ආයතනයෙහි නම පින්තාරු කර නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය සටහන් කිරීමට කටයුතු කරමින් පවතින බව. | සියළුම වාහනවල රාජ්‍ය ලාංඡන පින්තාරු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,408,894 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,033,166 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුවසමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්ත මේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,100,000 | 2,182,919 | 1,252,537 | 930,382 | 1,950,000 | 2,024,551 | 1,486,337 | 538,214 |
| (ii) | කුලී | 16,526,324 | 24,427,707 | 12,578,598 | 11,849,108 | 16,101,250 | 18,650,118 | 11,080,707 | 7,569,411 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 518,000 | 732,800 | 642,900 | 89,900 | 492,000 | 525,500 | 465,500 | 60,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,982,700 | 4,177,992 | 1,395,005 | 2,782,986 | 2,547,517 | 3,945,857 | 1,961,479 | 1,984,378 |
| | එකතුව | 22,127,024 | 31,521,418 | 15,869,040 | 15,652,376 | 21,090,767 | 25,146,026 | 14,994,023 | 10,152,003 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු රු.871,597ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු ශේෂයෙන් රු.120,798 ක් 2024.04.30 දින වන විට අයකරගෙන ඇති බව. | හිඟ ආදායම් නොපමාව අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ගෙවල් කුලී ආදායම රු.398,292 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ගෙවල් කුලී ආදායමින් 2024.04.30 දින වන විට රු.38,250 ක් අයකරගෙන ඇති බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ත්‍රීරෝද රථ ගාස්තු ආදායම රු.2,106,738 ක් අයකරගෙන නොතිබුණි. | ත්‍රීරෝද රථ ගාස්තු හිඟ ආදායමින් 2024.04.30 දින වන විට රු.143,855 ක් අයකරගෙන ඇති බව. | හිඟ ආදායම් නොපමාව අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.581,237 ක් සහ මුද්දර ගාස්තු රු.2,416,871 ක් ගෙන්වාගෙන නොතිබුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධ වෙමින් අඛන්ඩව කටයුතු කරන බව. | -එම- |

(ඉ) **වෙනත් ආදායම්**

| | |
|---|---|
| නගර සභාවට අයත් තානායම පවත්වාගෙනයාම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලැබිය යුතු 2007 වර්ෂයේ සිට හිඟ ආදායම් රු.4,049,018 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ශේෂය පරීක්ෂා කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ වූ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාව විසින් මාසිකව රැස් කරනු ලබන කසල ටොන් 24 ක ප්‍රමාණයක් කසළ කළමනාකරණ මධ්‍යස්ථානය අවට පරිසරයට බැහැර කර තිබුණි. | කසළ කළමණාකරණ මධ්‍යස්ථානය විධිමත් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට නගර සභාව අදහස් කර ඇති බව. | විධිමත්ව කසළ කළමනාකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1998 සිට 2015 දක්වා කාල සීමාව තුළ අවස්ථා 12 කදී අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු රු.157,277 ක් පියවාගෙන නොතිබුණි. | පැරණි හිඟ ශේෂයන් වන අතර තොරතුරු සොයා ගැනීමේ අපහසුවක් පවතින බව. | අත්තිකාරම් නිරවුල් කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 වර්ෂයෙන් පසු වරිපනම් බදු තක්සේකරුවක් කාලීනව සිදුකර අයකරගැනීම කර නොතිබුණි. | නව වරිපනම් බදු තක්සේරුව අවසන් කර ඇති අතර ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව. | කාලීනව වරිපනම් බදු තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් නගර සභාවට භාරදී තිබූ කම්පැක්ටරය සමාලෝචිත වර්ෂය දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | අදාළ කම්පැක්ටර් රථය අපහරණය කිරීම සඳහා මූල්‍ය කළමණාකරණ කාර්යාලයට භාරදී ඇති බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් සිදුකර තිබුණු නිර්දේශ අනුව Dell පරිගණකය, ජීඅයි බට, තණකොළ කපන යන්ත්‍රය, ඇලුමිනියම් ඉනිමඟ සහ තවත් කාර්යාල උපකරණ ඒකක 48 ක ඌණතාවය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර ඌනතාවයට හේතු හඳුනාගෙන නොතිබුණි . | ඌණ භාණ්ඩ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී ලේඛන යාවත්කාලීන නොවීම හා අදාළ භාණ්ඩ පරීක්ෂණ මණ්ඩලයට පෙන්වීමේ ගැටළු නිරීක්ෂණය වන බැවින් එම භාණ්ඩ සම්බන්ධයෙන් කමිටුවක් හරහා නැවත පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |